**ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1** **මතය**

-------

මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 නොවැම්බර් 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **මතය සඳහා පදනම**

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනයතුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කරතිබූ නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| | නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වර්ෂ 5ක් එකම සේවා ස්ථානයෙහි සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව තුළ වර්ෂ 5 ඉක්ම වූ නිලධාරීන් 9ක් සඳහා ස්ථාන මාරුවීම් ලබාදී නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදාල නිලධාරීන් ස්ථාන මාරුවීම් ඉල්ලුම් කළද ඔවුන්ට ස්ථාන මාරුවීම් නොලැබුණි. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 2018/02 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට අදාලව පවත්නා හා පැවතිය යුතු නිපුණතා අතර පරතරය පියවීම සඳහා කවර ආකාරයේ මානව සම්පත් සංවර්ධනයක් සිදුවිය යුතුදැයි අධ්‍යනයකර සෑම සාමාජිකයෙකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සැලසෙන අයුරින් දෙපාර්තමේන්තුවට සුවිශේෂීවූ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස්කළ යුතු අතර සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එසේ සිදුකර නොතිබුණි. තවද, දෙපාර්තමේන්තුවෙහි කාර්යමණ්ඩලයෙහි සාමාජිකයින් 59 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී පුහුණු අවස්ථා සලසා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂය සඳහා සැලැස්මක් සකස්කර තිබුණද කාර්ය සාධන ගිවිසුම් අත්සන කර නොතිබුණි. ලද ප්‍රතිපාදන, සේවා අවශ්‍යතාවය හා ප්‍රමුඛතාවය සලකා බලා පුහුණු අවස්ථා ලබා දෙන ලදි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | අධිකරණ අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ වාහනයක අයිතිය නිරවුල් කරගැනීමට 2020 සැප්තැම්බර් 30 දින වන විටත් කටයුතුකර නොතිබුණි. | භාවිතා කරනු ලබන වාහනවල ලියාපදිංචි අයිතිය නිරවුල් කරගත යුතු වීම. | අයිතිය පැවරීමේ අයදුම්පත්‍රය ලබා දෙන ලෙස අධිකරණ අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයයන් 4ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 2ක් සඳහා අවශ්‍ය මුළු ප්‍රතිපාදනයම සලසාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුළු ප්‍රතිපාදයෙන් රු.5,653,330 ක් හෙවත් සියයට 15 සිට සියයට 56 දක්වා වු පරාසයකට අයත් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | වර්ෂයේ අවශ්‍යතාවයක් නිසි පරිදි පුරෝකථනය කර අරමුදල් ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කළ යුතු වීම. | නියෝජ්‍ය මහා භාරකාර තනතුර සඳහා ඉන්ධන හා ප්‍රවාහන දීමනා අනුමත නොවීම, භාර/ බුදල්වලට අදාල නීතිඥ ගාස්තු අදාල භාර/ බුදල්වලින් දැරීම ආදී කරුණු හේතුවෙන් මෙම ඉතිරිවීම් සිදු විය. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාල බැරකම්වල වටිනාකම බැරකම් ලේඛනය අනුව රු.323,735ක් වුවද මූල්‍ය ප්‍රකාශනවලට අනුව එය රු.295,842ක් වුයෙන් රු.27,893ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් බැරකම් හා බැදීම් භාණ්ඩාගාර ලේඛන සමඟ එකඟ විය යුතු වීම. | 2019 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දින වනතුරු අදාල බිල්පත් ගිණුම් අංශයට ලැබී නොතිබීම නිසා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ නොහැකි විය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විවිධ බුදුලයන් යටතේ පවරා දෙන ලද වතු දේපළ 10 ක් මහා භාරකාරතැන විසින් කළමනාකරණය කරනු ලබන අතර එම දේපළ විධිමත්ව කළමනාකරණය කර ඒවායේ ආදායමින් ස්ථාපකගේ අරමුණු ඉටුකිරීම අපේක්ෂාකර තිබුණි. පසුගිය වසර හතරකදී වතුවලින් ලද ආදායම පිළිබඳ පරීක්ෂාවේදී 2016, 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් රු.3,744,310 ක, රු.9,336,629 ක හා රු.3,984,175 ක ලාභයක්ද, 2019 වර්ෂයේදී රු.6,222,482 ක අලාභයක්ද ලබා තිබුණි. මෙම වතුවල ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කිරීම තුළින් අදාල බුදල් හිමිකරුවන්ගේ අරමුණු ඉටුකිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | නැවත වගාකිරීමේ සැලසුම් සකස් කිරීම, බෝග විවිධාංගීකරණය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම, නැවත වගා කිරීම් සඳහා සහනාධාර ලබා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීම හා වතු සම්බන්ධ අධීක්ෂණ කටයුතු විධිමත් කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත |
| (ආ) | හැරී හපුගොඩ බුදලයට අයත් ගාල්ල නියාගම ප්‍රදේශයේ පිහිටි මුළු වපසරිය අක්කර 17ක් වූ මත්තක වත්ත නැමැති ඉඩමෙහි A සිට E දක්වා කොටස් 5කට බෙදා වෙන්කරන ලද අක්කර 15 රූඩ් 2 පර්චස් 38 ක ප්‍රමාණයෙන් A, D හා E කොටස්වල යම් ප්‍රමාණයක් තේ වගාකර තිබූ අතර B හා C කොටස් සම්පූර්ණයෙන් වල් බිහි වී තිබූ බැවින් වතු දේපළ නිසි පරිදි කළමනාකරණය කර නොමැති බව නිරීක්ෂණය විය. | වගා නොකළ බිම්වල වගා කිරීම් සඳහා රජයේ සහනාධාර ලබා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීම, වල් බිහිවූ ඉඩම් පිළිසකර කිරීමට කටයුතු කළ යුතු වීම හා වතු සම්බන්ධ අධීක්ෂණ කටයුතු විධිමත් කළ යුතු වීම. | 2019 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුවෙහිද මත්තක වත්තේ ක්ෂේත්‍ර අංක B කොටසේ අක්කර 2,1/2 නව තේ වගාවක් ආරම්භයට වියදම් ඇස්තමේන්තු කර තිබුනද, පසුගිය වසරේ පැවති අයහපත් මුදල් තත්වය මත එය සිදුකිරීම නොහැකි විය. |
| (ඇ) | සම්පූර්ණ භූමි ප්‍රමාණය අක්කර 17ක් වූ ඉහත (ආ) ඡේදයෙහි සඳහන් ඉඩමෙහි ඉතිරි අක්කර 1 රූඩ් 1 පර්චස් 2 ක භූමිය නිශ්චිතව හඳුනාගෙන ආරක්ෂිත මායිම් නිරවුල් කර ආරක්ෂිත වැට ඉදිකර කෘෂිකාර්මික කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතුකර නොතිබුණි. | එම ඉඩම් නිශ්චිතව හඳුනාගෙන, මැනුම් කටයුතු සිදුකර, ආරක්ෂිත වැට ඉදිකර සුදුසු කෘෂිකාර්මික වගාවක් සඳහා යොදාගත යුතු වීම. | අදහස් දක්වා නොමැත |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ඉහත (ආ) ඡේදයෙහි සඳහන් වත්තෙහි වතු බංගලාව අබලන් තත්ත්වයේ පවතින බවත් නඩත්තු කටයුතු දුර්වල මට්ටමක පවතින බවත් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මෙම වත්ත සඳහා වතු මුරකරුවෙකු සේවයේ යොදවා නොමැති අතර දෛනික පොලිස් මුර සංචාර සේවයක්ද ලබා ගෙන නොතිබුණි. දෛනික වැටුප ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දළු නෙලන්නන්ගේ පැමිණීම ඉතා දුර්වල මට්ටමක පැවති බව පැමිණීමේ ලේඛනවලින් තහවුරු වූ අතර මෙම පරිපාලනමය දුර්වලතා පිළිබඳ සලකා බලන විට අක්කර 17 ක් වූ ඉඩම් ප්‍රමාණය ඵලදායී අයුරින් කළමනාකරණය කිරීම සඳහා කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | වතු බංගලාවට අවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදුකළ යුතු වීම හා වතු සම්බන්ධ අධීක්ෂණ කටයුතු විධිමත් කළ යුතු වීම. | වතු බංගලාවේ විදුලි පද්ධතියේ අළුත්වැඩියා කටයුතු සිදුකර අවසන් කර ඇත. වර්තමානයේ පඩිපාලක සභා තිරණ මත තේ කර්මාන්තයේ සේවයේ යෙදෙන දෛනික වතු කම්කරුවකුට ගෙවිය යුතු වැටුප රුපියල් 640/= වුවත්, ප්‍රදේශයෙන් කම්කරුවන්ගේ සේවය ලබාගැනීමේ දුෂ්කරතාවය මත පිරිමි කම්කරුවකුට රු.1,043ක් ලෙසද, ගැහැණු කම්කරුවකුට රු.743ක් ලෙසද වැටුප් ගෙවනු ලැබේ. |
| (ඉ) | හැරී හපුගොඩ බුදලයට අයත් සුදුවැලිපොත වත්තෙහි අන්කුටුදූව නැමැති බිම් කොටසෙහි අක්කර 13.5 ක පමණ රබර් වගාකළ ඉඩමෙහි රබර් ගස් කිහිපයකින් පමණක් වර්තමානයේදී රබර් කිරි ලබාගන්නා අතර දිනකට එක් කම්කරුවකු පමණක් රබර් කිරි කපනු ලබන අතර බොහොමයක් ගස් ඉවත් කර නැවත පැළ වගාවන් සිදු කළ යුතු මට්ටමේ පවතින බව නිරීක්ෂණය විය. අනවසර ඉදිකිරීම් කිහිපයක්ද මෙම වත්තෙහි පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නැවත වගා කිරීම සඳහා රජයේ සහනාධාර ලබා ගැනීමේ හැකියාව සලකා බැලීම හා අනවසර ඉදිකිරීම් පවතින වතුවල මැනුම් කටයුතු සිදුකර අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නෛතික පියවර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. |
| (ඊ) | ඉහත සඳහන් වත්තෙහි පිහිටි වතු බංගලාවේ වහලෙහි පරාල හා ජනෙල් උළුවහු දිරාපත් වී තිබුණු අතර වහලෙහි ඇතැම් කොටස් ඉටිකොළවලින් ආවරණය කර තිබුණි. එම බංගලාවෙහි වතු අධිකාරී සහ ක්ෂේත්‍ර නිලධාරියෙකු නවාතැන්ගෙන සිටියද, අබලන් තත්ත්වය හේතුවෙන් නවාතැන් ගැනීමට සුදුසු මට්ටමක නොමැති බවත්, කඩිනම් පිළිසකර කිරීමක් අවශ්‍ය බවත් නිරීක්ෂණය විය. | වතු බංගලාවට අවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදුකළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. |
| (උ) | එන්. ඩී. එස්. සිල්වා විජේසිංහ බුදලයට අයත් කලුතර දිස්ත්‍රික්කයෙහි පිහිටි රිච්මන්ඩ් මන්දිරයෙහි වහලය අබලන් වීම හේතුවෙන් බොහෝ ස්ථාන ගරා වැටෙන තත්ත්වයක්ද, පියගැටපෙළ සහ මන්දිරයේ නැරඹුම් මැදිරිය | මන්දිරය සංරක්ෂණය කිරීම සඳහා කටයුතු කළ යුතු වීම | මන්දිරයෙහි සංරක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා 2018 වසරේදී මොරටුව විශ්ව විද්‍යාලයෙහි මහාචාර්යවරයෙකු හා |

| | | | |
|---|---|---|---|
| | අනාරක්ෂිත බවද, මෙම මන්දිර පරිශ්‍රයෙහි පිහිටුවා ඇති ළමා නිවාසයෙහි ශිෂ්‍ය නේවාසිකාගාරයෙහි බිත්ති ඉරිතැලී අබලන් තත්ත්වයකට පත්ව ඇති බවද නිරීක්ෂණය වූයෙන් කඩිනමින් පිළිසකර කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය. වර්ෂ 100 කට අධික ඉතිහාසයක් සහිත පෞරාණික වැදගත්කමකින් හෙබි මෙම මන්දිරය සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාවයක් පැවතියද මන්දිරය සඳහා පසුගිය වර්ෂ 10 ක කාලය තුළ කිසිදු අලුත්වැඩියා කිරීමක් සිදු කර නොතිබුණි. | | අමාත්‍යාංශයේ ලේකම්තුමිය අතර සාකච්ඡා පැවතුණද, මන්දිරයෙහි සංරක්ෂණ කටයුතු සඳහා යෙදවීමට තරම් ප්‍රමාණවත් මුදලක් නොමැති බැවින් එම කටයුතු තාවකාලිකව නතර කිරීමට සිදු විය. එතෙක් නඩත්තු කටයුතු වෙනුවෙන් ප්‍රායෝගිකව කළහැකි සියලු ක්‍රියාකාරකම් උපරිම අයුරින් ඉටුකරනු ලැබේ. නේවාසිකාගාරය යථා තත්ත්වයට පත්කිරීම සඳහා ඉදිරි කටයුතු කරනු ලැබේ. |
| (ඌ) | ඉහත (උ) ඡේදයෙහි සඳහන් බූදල්කරුගේ අන්තිම කැමති පත්‍රයෙහි පෞරාණික වටිනාකමකින් යුත් කෞතුක භාණ්ඩ ලැයිස්තුවක් සඳහන්කර තිබූ අතර එම කෞතුක භාණ්ඩ ඉහත සඳහන් මන්දිරයෙහි තැන්පත්කර සංරක්ෂණය කළයුතු බව සඳහන් කර තිබුණි. එහෙත් එම කෞතුක භාණ්ඩ අතරින් කෞතුක භාණ්ඩ කිහිපයක් පමණක් දෙපාර්තමේන්තුවේ සේප්පුවක තබා ඇති බව නිරීක්ෂණය වූ අතර අනෙකුත් කෞතුක භාණ්ඩ පවතින ස්ථානය පිළිබඳව දෙපාර්තමේන්තුව සතුව වාර්තා නොවීය. | කෞතුක භාණ්ඩ සංරක්ෂණය සඳහා කටයුතු කළ යුතු වීම. | මෙම බූදලයටට අයත් භාණ්ඩවල තොරතුරු දෙපාර්තමේන්තුවතුළ ඇති සේප්පුවලින් නැවත සමීක්ෂණයකර ලබා ගැනීමට මේවන විට කටයුතු සිදුකර ඇති අතර ඉන් අනතුරුව සංරක්ෂණය කිරීමේ කටයුතු මහා භාරකාරවරයාගේ අනුමැතිය පරිදි සිදු කරනු ලබයි. |
| (එ) | අයි.ඩබ්ලිව්.සී විජේරත්න බූදලයට අයත් නෝර්ටන් බ්‍රිජ්හි පිහිටි නිවස හා ඉඩම 1993 දෙසැම්බර් 07 දින වැඩිහිටි නිවාසයක් පවත්වා ගෙන යෑම සඳහා ගිනිගත්හේන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත භාරදී තිබුණි. එහෙත්, බූදලයට අයත් නිශ්චල දේපළ, වෙනත් පාර්ශවයක් වෙත ලබාදීමේදී නිවස භාරදීම හා නඩත්තු කිරීම යනාදී කරුණු පිළිබඳව විධිමත් පරිදි එකඟතාවයක් ඇතිකර ගැනීම සඳහා ගිවිසුමකට එළඹිය යුතු වුවත් 2019 දෙසැම්බර් 10 දින වනවිට වර්ෂ 26 ක් ගත වී තිබුණද, විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. | බාහිර පාර්ශවයන්ට බූදල් දේපළ බදු පදනමින් ලබාදීමේදී විධිමත් බදු ගිවිසුම්වලට එළඹිය යුතු වීම. | අදහස් දක්වා නොමැත. |
| (ඒ) | සී. ඊ. වනිගසූරිය බූදලයට අයත් දේපළ විකුණා බූදල්කරුගේ නමින් භාරයක් පිහිටුවීම සඳහා මහා භාරකාරතැන වෙත 2005 නොවැම්බර් 10 දින අද්මිනිස්ත්‍රාසි බලතල ලැබී තිබුණි. එහෙත් | අදාල ඉඩම් හා ගොඩනැඟිලි හඳුනාගෙන මහා භාරකාරතැනගේ | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| | 2019 දෙසැම්බර් වන විට වර්ෂ 14 ක කාලයක් ගත වී තිබුණද, අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව ප්‍රදේශ 7ක පිහිටා තිබූ ඉඩම් හා ගොඩනැඟිලි හඳුනාගෙන මහා භාරකාරතැනගේ අයිතිය තහවුරුවන පරිදි ආරක්ෂා කිරීමටත් එම දේපළ විකුණා බුදල්කරුගේ අරමුණු ඉටුකිරීමටත් කටයුතුකර නොතිබුණි. | අයිතිය තහවුරුකර බූදල්කරුගේ අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | |
| (ඔ) | 2019 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2020 ජූලි 16 දින විගණනය වෙත ලැබී තිබුණු නමුත් දෙපාර්තමේන්තුව විසින් පාලනය කරනු ලබන වතුවලට අදාළව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු සියළු වත්කම් සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වත්කම් තහවුරු කළ යුතු වීම. | දෙපාර්තමේන්තුව විසින් පාලනය කරනු ලබන වතුවලට අදාළව භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොමැති බව පිළිගන්නා අතර ඉදිරියේදී ඒ සඳහා කටයුතු කරමි. |

**3.2 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | ----------------------- | ----------- | --------------------------- |
| (අ) | ඩී. එස්. ඩබ්ලිව් සමරකෝන් බූදලයට අයත් සයිමන්ඩේල්වත්ත ඉඩමෙහි අක්කර 16 රූඩ් 01 පර්චස් 35ක් 1982 අගෝස්තු 27 දින රජයට පවරාගෙන තිබුණු අතර, ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති රු. මිලියන 4.69ක වන්දි හා පොළී අයකර ගෙන නොතිබුණි. තවද, මෙම ඉඩම සඳහා තීරණය වූ වන්දි මුදල ලෙස රු. මිලියන 2.63ක් බව 2013 ජනවාරි 16 දින කැස්බෑව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා තිබූ අතර 2014 නොවැම්බර් 20 දින එම වන්දි මුදල රු. මිලියන 1.79ක් බව දන්වා තිබුණි. අත්කර ගැනීමේ නිලධාරී විසින් දැනුම්දෙන ලද වන්දි සම්බන්ධ තීරණය පිළිබඳව සෑහීමකට පත් නොවන්නේ නම් එම තීරණය ලැබී දින 21 ක් ඇතුළත වන්දි සමාලෝචන මණ්ඩලයට ඇපැලක් ඉදිරිපත් කිරීමේ හැකියාව පැවතියද, දෙපාර්තමේන්තුව විසින් එසේ කටයුතු කර නොතිබුණු අතර අහිමි වූ වන්දි සම්බන්ධ ගැටලුව 2019 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගෙන නොතිබුණි. | රජයට පවරා ගත් බූදල් ඉඩම් වලට අදාළ වන්දි මුදල් හා පොළී මුදල් බූදලය වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතුවීම. | ලැබිය යුතු වන්දි හා පොළී ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. තක්සේරු වාර්තාවල වෙනස සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරුගෙන් විමසා ඇති බවත්, අඩු වී ඇති ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් කොළඹ කොට්ඨාශයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙතින් කරුණු විමසා ඇති බවත්, වන්දි මුදල් දෙක අතර වෙනස සම්බන්ධයෙන් කළ විමසීම්වලදී 2019 අගෝස්තු 21 දින කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1968 අගෝස්තු 11 දින සිංගප්පූරුවේදී මියගිය ෆ්ලොරන්ස් ඊනිඩ් විදම් මහත්මියගේ ශ්‍රී ලංකාවේ පැවති නිශ්චල හා චංචල දේපළ විකුණා ලැබෙන මුදල් උරුමකරුවන්ට/ අර්ථලාභීන්ට ලබාදීම සඳහා ඇටර්නි බලකරු ලෙස 1975 වර්ෂයේදී ශ්‍රී ලංකා මහා භාරකාරවරයා පත්කර තිබුණි. කොළඹ 05, හැව්ලොක් පාර, අංක 19 දරන ස්ථානයෙහි පිහිටි රූඩ් 01 පර්චස් 3.13 ක වර්ග ප්‍රමාණයකින් යුත් ඉඩම හා ගොඩනැගිල්ල විකුණා ලද මුදලින් රු.64,645,776ක් උරුමකරුවන්/ අර්ථලාභීන් අතර බෙදාහැරීමට නියමිතව පැවති අතර ඉන් රු.35,880,064 ක මුදලක් උරුමකරුවන්/ අර්ථලාභීන් 30 දෙනෙකුට ලබාදී තිබුණි. තවදුරටත් අර්ථලාභීන් 16 දෙනෙකු වෙත රු.28,765,712 ක් ගෙවිය යුතුව තිබුණු නමුත් දේපළ විකුණා වර්ෂ 8කට අධික කාලයක් ගත වී තිබුණද ඒ සඳහා කටයුතුකර නොතිබුණි. තවද, දේපළ විකිණීමෙන් ලැබෙන මුදල සහ ඊට එකතුවන පොළිය මියගිය අයගේ උරුමකරුවන්ට බෙදා හැරිය යුතු බව අධිකරණයෙන් දන්වා තිබුණද, රු.24,531,570ක් අර්ථලාභීන් 16 ක් අතර 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේදී බෙදාහැරීමේදී, එම මුදල් නිදහස් කරන තෙක් ඵලදායී ආයෝජන මාර්ගවල නොයෙදීම හේතුවෙන් අර්ථලාභීන්ට හිමි විය යුතුව තිබූ පොළී මුදල් අහිමිවී තිබුණි. | අර්ථලාභීන්ට මුදල් ගෙවීමට කටයුතු කල යුතු වීම හා මුදල් ගෙවන තෙක් අරමුදල් ඵලදායී අයුරින් ආයෝජනය කළ යුතු වීම. | මෙම මුදල් ලබා දීමේදී අර්ථලාභීන්ගේ ඉල්ලීම පරිදි සිදුකර ඇත. අර්ථලාභීන් වෙත බෙදාහැරීම සඳහා ඇති මුදල් 2019 වර්ෂයේදී ආයෝජනය කර ඇත. |
| (ඇ) | ආර්. එල්. එච්. චන්ද්‍රසේකර යන අයගේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පොතානේගම පිහිටි අක්කර 18 රූඩ් 03 පර්චස් 01 ක් හා අක්කර 17 රූඩ් 02 පර්චස් 23ක් වූ ඉඩම් සඳහා මහා භාරකාරතැන විසින් 2000 ජූලි 04 දින තාවකාලික බදුකරුවෙකු පත් කර තිබුණි. එහෙත් විධිමත් බදු ගිවිසුමකට එළඹීමට 2020 ජනවාරි වනවිටත් කටයුතු කර නොතිබුණි. නිශ්චිත වශයෙන්ම අඳ ගොවියා විසින් වගාකළ කුඹුරු අක්කර ගණන කොතෙක්ද, අදාළ කන්නයේ වී සඳහා වූ සහතික මිල කොතෙක්ද හා පොල් ඉඩමෙන් වගා කළ ප්‍රමාණය හා අස්වැන්න කොතෙක්ද ඒ අනුව ප්‍රවේණි ලැබීම නිවැරදි ද යන්න සම්බන්ධයෙන් මහාභාරකාර දෙපාර්තමේන්තුව විසින් කිසිදු අවස්ථාවක අධීක්ෂණයක් හෝ පසු විපරමක් කර නොතිබුණු අතර අඳ ගොවියා විසින් ඔහුගේ කැමැත්ත පරිදි ගෙවන ප්‍රවේණිය භාරගෙන ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව 2000 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අක්කර 36 රූඩ් 1 පර්චස් 24 කින් ලද ආදායම රු.3,575,542 ක් පමණක් විය. | බාහිර පාර්ශවයන්ට බූදල් දේපළ බදු පදනමින් ලබාදීමේදී දේපළවල ආරක්ෂාවත්, ඉන් සාධාරණ ආදායමක් ලැබීමත් තහවුරු කිරීම සඳහා විධිමත් බදු ගිවිසුම්වලට එළඹිය යුතු වීම හා බදු පැහැර හැර ඇති දේපළ නැවත ලබා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉහත (ඇ) ඡේදයෙහි සඳහන් කරන ලද බූදලයට අයත් අනුරාධපුර පැරණි නගරයේ කුරුණෑගල පාරේ අංක 238 හා 239 දරන වෙළෙඳ ගොඩනැගිලි හා භූමිය විධිමත් ගිවිසුමකින් තොරව බදු දී තිබුණු අතර 2000 වර්ෂයේ මාර්තු සිට බදුකරු බදු මුදල් ගෙවීම පැහැර හැර තිබූ අතර ඉන් අනතුරුව එම දේපළ කළමනාකරණය සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි. | -එම- | අදහස් දක්වා නොමැත. |
| (ඉ) | වීරසිංහ අබේනායක බූදලයට අයත් මාතර ගබඩා වීදියේ පර්චස් 32 ක් විශාල ඉඩම හා ගොඩනැගිල්ල 2013 වර්ෂය දක්වා ඵලදායී අයුරින් කළමනාකරණය කර නොතිබුණු අතර 2013 පෙබරවාරි 05 දින රු.8000ක මාසික කුළියකට බදු දී තිබුණි. උක්ත බදු ගිවිසුම 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණි. මෙම දේපළ විකිණීම සඳහා නඩු අංක 97/16 යටතේ 2016 සැප්තැම්බර් 29 දින කොළඹ දිසා අධිකරණයේ දිසා විනිසුරුවරයාගේ අවසරය ලබාගෙන තිබුණද දේපළ විකුණා අරමුදලට බැර කිරීම වෙනුවට විධිමත් බදු ගිවිසුමකට එළඹීමෙන් තොරව ඉහත බදුකරුටම මාසිකව රු10,000 ක මුදලකට බදු දී තිබුණි. | විකිණීම සඳහා අධිකරණ අවසරය ලද ඉඩම් හා ගොඩනැගිලි විකුණා බූදලයේ අරමුණු ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම | අදහස් දක්වා නොමැත. |
| (ඊ) | ඩී. ජේ. ඩී. ජේ. අබේසේකර බූදලයට අයත් ගාල්ල ඇල්පිටිය ප්‍රදේශයෙහි පිහිටි කඩකාමරයක් හා ඉඩමක් වසර 20කට වැඩි කාලයක සිට ගිවිසුම්වලින් තොරව බදු දී තිබුණි. 2013 හා 2015 වර්ෂවලදී රු.1,100,000 ක් හා රු.2,300,000ක් ලෙස තක්සේරු කරන ලද මෙම කඩ කාමරය හා ඉඩම දැනට භුක්ති විඳිනු ලබන බදුකරුවන් විසින් තක්සේරු වටිනාකමට මිලදී ගැනීමට එකඟ වූ බව සඳහන් කළද, ඒ සඳහා ලිඛිත එකඟතාවයක් නොවීය. තවද, කඩකාමරය වෙනුවෙන් 2018 මැයි දක්වා රු.227,380 ක්ද, ඉඩම සඳහා 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.143,400 ක්ද වශයෙන් බදු කුලී අයවිය යුතු බව ගණනය කර තිබුණද, එම මුදල් ද ඇතුළුව 2019 වර්ෂය දක්වා අයවිය යුතු බදු කුලී අයකර ගෙන නොතිබුණි. | බාහිර පාර්ශවයන්ට බූදල් දේපළ බදු පදනමින් ලබාදීමේදී දේපළවල ආරක්ෂාවත්, ඉන් සාධාරණ ආදායමක් ලැබීමත් තහවුරු කිරීම සඳහා විධිමත් බදු ගිවිසුම්වලට එළඹිය යුතු වීම හා බදු පැහැර හැර ඇති දේපළ නැවත ලබා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (උ) | නුගේගොඩ ප්‍රදේශයේ පදිංචිව සිටි ජී. එස්. ජයසූරිය නැමැති අයගේ බූදලය සම්බන්ධයෙන් වූ අද්මිනිස්ත්‍රාසි බලතල 1982 වර්ෂයේදී මහා භාරකාරතැන වෙත ලැබී තිබුණි. බූදල්කරුගේ නැසීගිය පළමු බිරිදට අයත්ව තිබූ ඉඩමක් 1999 වර්ෂයේදී රජයට පවරාගෙන තිබුණු අතර ඇයගේ අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් කොන්දේසි ප්‍රකාරව එම ඉඩම සඳහා බූදල්කරුට හිමිකමක් නොමැති වුවද වන්දි හිමිකම් ඉල්ලුම්කර 2000 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා නීතිඥ ගාස්තු ලෙස රු.2,962,430 ක් දරා තිබුණි. එහෙත්, 2019 ඔක්තෝබර් 23 දින ලද අංක 522/00/විශේෂ දරන නඩුවේ නියෝගය ප්‍රකාරව එකී දේපළට අදාලව වන්දි හිමිකමක් නොමැති බව තීන්දුකර තිබුණි. එබැවින්, හිමිකමක් නොමැති දේපළක් වෙනුවෙන් අනවශ්‍ය ලෙස කාලය හා අරමුදල් වැය කිරීම හේතුවෙන් පුණ්‍යාධාර, වෛද්‍යාධාර හා ශිෂ්‍යාධාර ලබාදීම ආදී බූදල්කරුගේ අරමුණු 2010 වර්ෂයේ සිට ඉටු කිරීමට නොහැකිවී තිබුණි. | දෙපාර්තමේන්තුව සඳහා නෛතික හිමිකමක් ඇති දේපළ සම්බන්ධයෙන් පමණක් වූ නඩු කටයුතුවලට සම්බන්ධ විය යුතු වීම. | දෙපාර්තමේන්තුව විසින් වන්දි සඳහා ඉල්ලුම්කර වන්දි පරීක්ෂණය සඳහා යොමු වූ පසු මොරටුව ප්‍රාදේශීය ලේකම් විසින් ගොනුකර ඇති නඩුවේ මහා භාරකාරතැන පාර්ශවකරුවකු ලෙස නම්කර ඇත. ඒ අනුව වෘත්තීය ගාස්තු ගෙවා ඇත. |
| (ඌ) | හැරී හපුගොඩ මහතාගේ අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව සෑම වසරකදීම බූදලයේ ආදායමින් 1/5 ක් ඉතිරි කළ යුතු බවත් එම ඉතිරිය රු.100,000 වූ විට එය ශිෂ්‍යාධාර පිරිනැමීමට හා ආපදා තත්වයන්හිදී සහන සැලසීමට රැස් කර තැබිය යුතු බවත් දක්වා තිබුණි. එසේ වුවත් එම අරමුණු ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ආදායම් ඉතිරි කර නොතිබුණි. 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ වර්ෂ 5 ක කාලයේදී රු.24,865,439 ක ආදායම් උපයා තිබුණු අතර එයින් රු.4,973,088 ක් ඉතිරි කළ යුතු වුවත් එසේ ඉතිරි කර නොතිබුණි. | අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. |
| (එ) | පුද්ගල භාර අංශය මඟින් කළමනාකරණය කරනු ලබන භාර 20කට අදාලව 2019 හා 2018 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව මුලු වත්කම් පිළිවෙලින් රු.17,402,203ක් හා 16,655,856ක්ද, ආයෝජන ආදායම් රු.938,729ක් හා රු.1,096,900ක්ද ලෙස දක්නට ලැබුණද එම භාරවල අරමුණු ඉටු කිරීමකින් තොරව අක්‍රීය මට්ටමෙහි පැවතුණි. | අරමුණු ඉටුකිරීම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩල ලිඛිතව දැනුවත් කළ යුතු වීම. | භාරකාර මණ්ඩල අක්‍රීය වීම, භාරකාර මණ්ඩල ඉල්ලීම් ඉදිරිපත් නොකිරීම, අර්ථලාභීන් සොයාගැනීමේ අපහසුව ආදී කරුණු හේතුවෙන් අරමුණු ඉටු කළ නොහැකි විය. |
| (ඒ) | විවෘත නොකරන ලද අන්තිම කැමති පත්‍ර 254 ක් විවෘත කිරීම සම්බන්ධයෙන් වූ නීති කටයුතු වෙනුවෙන් රු.2,629,250 ක් වැය කර තිබුණු අතර ඒ සඳහා ඩී. එස්. ඩබ්. සමරකෝන් බූදලයේ අරමුදල් භාවිතාකර තිබුණි. එම බූදලයට අදාලව ඉටුකළ යුතු | බූදල්කරුවන් විසින් අන්තිම කැමති පත්‍රවල නිශ්චිතව සඳහන්කර ඇති අරමුණු ඉටුකිරීම | අධිකරණ කාර්යයන් අවසානයේදී එම අන්තිම කැමති පත්‍රවල ඇති දේපළවලින් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත |

| | | | |
|---|---|---|---|
| | කාර්යයන් බුදල්කරු විසින් සිය අන්තිම කැමති පත්‍රයෙහි නිශ්චිතව සඳහන්කර තිබූ බැවින් මෙම වියදම් දැරීම අරමුණුවලට පටහැනි බව නිරීක්ෂණය කෙරේ. | සඳහා පමණක් බූදල් දේපළ උපයෝජනය කළ යුතු වීම. | මහාභාරකාර තැනගේ අභිමතය පරිදි මෙම බූදලයෙන් ගෙවන ලදී. |
| (ඔ) | 1973 අංක 28 දරන සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම් (විශේෂ විධිවිධාන) පනත මගින් ලේක්හවුස් ආයතනය රජයට පවරා ගැනීමේ දී රජය වෙනුවෙන් කොටස් දැරීම සඳහා මහාභාරකාරවරයා නම් කර තිබුණි. ඒ අනුව රජය වෙනුවෙන් මහාභාරකාරතැන වෙත සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සාමාන්‍ය කොටස් 3,050,379 ක් එනම් සියයට 87.5 ක හිමිකාරිත්වය ලබාගෙන තිබුණද, ඒ සම්බන්ධව හා ඒ මත උපයන ලාභාංශ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ භාර/බූදල් ගිණුම්වල කිසිදු හෙළිදරව් කිරීමක් කර නොතිබුණි. | සියලුම ආයෝජන හා ඒ මගින ලැබෙන ලාභාංශ සියල්ලම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයෙහි දැක්විය යුතු වීම | වාර්ෂිකව ලැබෙන ලාභාංශ එම ලාභාංශ ලැබෙන මාසයේදීම ගිණුම් සාරාංශ මගින් මහාභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරනු ලැබේ. |
| (ඕ) | භාර/බූදල් 6ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂය එකතුව රු.16,621,711ක හර ශේෂයක් ඇතිවන සේ වියදම් දරා තිබුණු අතර, ඉන් භාර/බූදල් 2කට අදාලව එකතුව රු.1,341,833ක් වූ හර ශේෂයන් පියවීම සඳහා එම බූදල් සඳහා ආයෝජන කිසිවක් නොවීය. | එක් එක් භාරය/බූදලය සඳහා ලැබෙන ආදායම් සීමාවතුළ වියදම් දැරීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රමුඛ බැංකුවෙහි සිදුකළ ආයෝජන සඳහා නිසි පරිදි පොළී නොලැබීමත්, අර්ථලාභීන්ට ගෙවීම් කිරීමට සිදු වීමත්, බූදල් කළමනාකරණයේදී පිරිවැයක් දැරීමට සිදුවීමත් හේතුවෙන් මෙම හර ශේෂ ඇති විය. ආයෝජන ආදායම් හා ගෙවල් කුළී ආදායම් මගින් එම ශේෂ පියවීමට කටයුතු කරනු ලැබේ. |
| (ක) | විවිධ අනපනත් හරහා දෙපාර්තමේන්තුවට සුවිශේෂී කාර්යභාරයක් පැවරී ඇති අතර ඒ අනුව දෙපාර්තමේන්තුවෙන් විවිධ පාර්ශවයන්ට විවිධ සේවාවන් සපයනු ලබයි. එහෙත් දෙපාර්තමේන්තුවෙන් ඉටුකරන කාර්යයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. දෙපාර්තමේන්තුව නමින් වෙබ් පිටුවක් සකස් කර තිබුණද, එය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පරිශීලනය කිරීම සඳහා පහසුකම් සලසා නොතිබුණි. තවද, දෙපාර්තමේන්තුවේ පසුබිම, මහා භාරකාරතැනගේ කාර්යභාරය හා එක් එක් අංශවල කාර්යභාරය පමණක් එහි ඇතුළත් කර තිබුණු අතර, | වෙබ් පිටුව භාෂා ත්‍රිත්වයෙන්ම යාවත්කාලීනව පවත්වාගෙන යාම, අන්තිම කැමති පත්‍රයක් ලිවීම සම්බන්ධ උපදෙස් හා ආකෘති, ශිෂ්‍යාධාර හා වෛද්‍යාධාර ආදි ආධාර ඉල්ලුම් පත්‍ර ආදිය වෙබ් පිටුව හරහා බාගත | අදහස් දක්වා නොමැත. |

| | |
|---|---|
| මහජනතාවට විස්තරාත්මක තොරතුරු ලබාගත හැකි වන පරිදි සහ සිය දේපළවල භාරකරු ලෙස මහා භාරකාරතැන පත්කිරීම සඳහා උනන්දුවක් ඇතිවන පරිදි තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | කිරීමේ පහසුකම් සැලසීම හා ජනතාවගේ අදහස්, යෝජනා හා පැමිණිලි භාර ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| "තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක්ම විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් අදාළ වන තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධනය න්‍යාය පත්‍රයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | දෙපාර්තමේන්තුවේ පාලන අංශයේ පරිපාලන නිලධාරී තනතුර හා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී තනතුර පුරප්පාඩුව පවතින අතර එහි ජ්‍යේෂ්ඨ නිලධාරීන්ද සේවය කරනු නොලබයි. එබැවින් න්‍යාය පත්‍රය ප්‍රකාරව කටයුතු කිරීමට නොහැකි විය. 2021 වර්ෂය ආරම්භයේදී තිරසර සංවර්ධනය හඳුනා ගැනීමේ හා මැන බැලීමේ කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. |

5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය<br>--------------------- | නිර්දේශය<br>------------ | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම<br>---------------------------- |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත, තත්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිවෙලින් 87 69, හා 18 ක් විය. පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් නොතිබූ අතර පරිපාලන නිලධාරී තනතුරද 2015 ජුලි සිට පුරප්පාඩුව පැවතුණි. තවද, 2018 මැයි 21 දින නීති නිලධාරී තනතුරක් අනුමතකර ගෙන තිබුණද, ඒ සඳහා නිලධාරියෙකු බඳවා ගෙන නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ. |